GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/09/12

**මාධ්‍ය නිවේදනයයි**

**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය රුපියල් මිලියන 500 ක වන්දියක් ඉල්ලා හරස් ඉල්ලීමක් ඉදිරිපත් කරයි.**

වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න ඇතුලු පිරිසක් ගල්කිස්ස දිසා අධිකරණයට අසත්‍ය කරුණු ඉදිරිපත් කරමින් පසුගිය ජුලි මාසයේදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ එහි විධායක සභාව ක්‍රියාත්මකවීම වලක්වාලමින් වාරණ නියෝගයක් ලබා ගෙන තිබුණි. මෙම නියෝගය හේතුවෙන් මාසයක පමණ කාලයක් සංගමය අකර්මන්‍යව පැවති අතර පසුව පැවති නඩු විභාගයේදී එම වාරණය ගල්කිස්ස දිසා අධිකරණය විසින් ඉවත් කරන ලදි. පැමිණිලි පාර්ශවය අසත්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බවත්, වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය නිමල් රත්නසේන යන විශේෂඥ වෛද්‍යවරුන් ව්‍යවස්ථාවයට පටහැනිව ක්‍රියාකර ඇති බව සඳහන් කරමින් ගරු අධිකරණය විසින් පිටු 30ක පමණ දීර්ඝ තීන්දුවක් ප්‍රකාශයට පත් කරන ලදි.

එම තීන්දුව සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය දැනට ගල්කිස්ස අභියාචනාධිකරණයෙහි ඇපෑලක් ගොනු කර ඇත.

මේ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා ඇතුලු විධායක සභාව සහ මැතිවරණ කමිටුව තමන්ට ඉහත වාරණය හරහා සිදුවූ අපකීර්තිය සහ පීඩාව සම්බන්ධයෙන් වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න ඇතුලු පැමිණිලි පාර්ශවයෙන් රුපියල් මිලියන 500ක වන්දියක් ඉල්ලා හරස් ඉල්ලීමක් සැප්තැම්බර් 11 වන දින අධිකරණයට භාර දී ඇත.

මෙහිදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන්, එහි විධායක සභාව සහ මැතිවරණ කමිටුව වෙනුවෙන් ජනාධිපති නීතිඥවරුන් වන රොමේෂ් ද සිල්වා සහ ගාමිණී මාරපන යන මහත්වරුන් සහ නීතිඥ අරුල්ප්‍රකාශම්, නීතිඥ රවින්ද්‍රනාත් දාබරේ යන මහත්වරුන් පෙනී සිටිති.

ස්තූතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය නලින්ද හේරත් - 0717876516